# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
# DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.02. 03

**නියාමන උපදෙස් - බැ/නි/ඒ/2021/04**

සියලුම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

## ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් සිය අතිරික්ත අරමුදල් මූල්‍ය සමාගම්වල ආයෝජනය කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස්

### 01. හැඳින්වීම

- ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් සිය අතිරික්ත තැන්පත් අරමුදල් බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකුවල තැන්පත් නොකර, අධික පොළී අපේක්ෂාවෙන් මූල්‍ය සමාගම් වල තැන්පත් කිරීමේ පරිචයක් අරඹා ඇති අතර, මෙසේ කරනු ලබන තැන්පත් පිළිබඳව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගත් අවස්ථා සහ ඇතැම් සමිති විසින් තැන්පත් කරන ලද මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වීමෙන් ද්‍රවශීලතා අර්බුද වලට මුහුණ දී තැන්පත්කරුවන් මුදල් ඉල්ලූ විගස ගෙවීමට නොහැකි වීමෙන් විශ්වාසය පළුදු වී එය සමස්ත සමුපකාර මූල්‍ය සේවා පද්ධතියටම ප්‍රශ්න ගත තත්ත්වයන් උදා කර ඇත.
- මෙම තත්ත්වයට සඵලදායී විසඳුම් ලෙස ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් වල ආයෝජනයන් සිදු කළ යුතු ආකාරය පිළිබඳව සමිති විසින් තරයේ අනුගමනය කළ යුතු මඟපෙන්වීම්, උපදෙස් සහ නියෝගයන් (Guidelines and Directions) අවධාරණය කරලීම මෙම නියාමන උපදෙස් නිකුත් කිරීමේ අපේක්ෂාව වේ.

### 02. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල ආයෝජනය

- ආයෝජනය කළ හැකි විශ්වාසනීය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මොනවා ද යන්න එම තීරණයන් ගැනීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහ සමිතියේ ආයෝජන සහ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) විසින් විශ්ලේෂණාත්මකව හඳුනා ගත යුතු ය.

  ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් මස 06 වෙනි දින www.cbsl.gov.lk යන වෙබ් අඩවියේ පළ කර ඇති තොරතුරු අනුව වර්ග 02ක් මූල්‍ය සමාගම් විශේෂයෙන් පෙන්වා දී ඇත.

එනම්,

- අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා සපුරා නොමැති එම විධානයන්ට අනුකූල වීම සඳහා කාල දිගුවක් ලබා දී ඇති මූල්‍ය සමාගම්, සහ

අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාව සපුරා නොමැති සහ මේ දක්වා ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ පිළිගත හැකි සැලැස්මක් ඉදිරිපත් කර නොමැති මූල්‍ය සමාගම් වශයෙන් ය.

මින් පළමු ගණයට අයත් වන මූල්‍ය සමාගම්

- Arpico Finance PLC
- Associated Motor Finance Company
- Bimputh Finance PLC
- Kanrich Finance Limited
- Merchant Bank of SL PLC
- Richard Pieris Finance PLC
- Softlogic Finance PLC
- UB Finance PLC

මින් දෙවන ගණයට අයත් වන මූල්‍ය සමාගම්

- Nation Finance PLC

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙම අවදානම් හඳුනා ගැනීමේ වර්ගීකරණයන් ක්ෂණිකව වෙනස් වීමේ අනතුරුදායක තත්ත්වයන්ට යටත් වේ.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් තැන්පත් කරන මූල්‍ය සමාගම් පිළිබඳව පළ කරන දැන්වීමෙහි අවදානම් සහිත එක් එක් මූල්‍ය සමාගම් පිළිබඳව නම් වශයෙන් සඳහන් නොකරන අතර, ඒවායේ තැන්පත් කිරීමේ අවදානම තැන්පත්කරුවන් විසින් තම තමා විසින් අවබෝධ කර ගෙන දැරිය යුතු බව අවධාරණය කර ඇත.

**සටහන**

*"........ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක තැන්පත් පිළිබඳ සහතික වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලයක් නොමැත. තැන්පතු ඇතුළුව සිදු කරනු ලබන ඕනෑම ආයෝජනයක ප්‍රතිලාභ සමඟ ධනාත්මක ලෙස සම්බන්ධ වන බැවින් ඒ පිළිබඳ මහජනතාවගේ අවදානය යොමු කරනු ලැබේ.*

*තම තැන්පතු සඳහා එක් ආයතනයක් වෙත උපරිමය ලක්ෂ 6ක් දක්වා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රම යටතේ වන්දි ගෙවන අතර, මෙම වන්දි ගෙවනුයේ තැන්පතු සඳහා පමණක් වන අතර අනෙකුත් මුදල් ලබා ගැනීමේ උපකරණ සඳහා ගෙවීම් සිදු කිරීම ආවරණය නොවේ.*

*මෙම කරුණ පිළිබඳ අවධානය යොමු කරමින් තමන් විසින් තැන්පත් කරනු ලබන අරමුදල් වල සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සැළකිලිමත් වන ලෙස සහ අනවසර ආයතන වල සහ පුද්ගලයින් සමඟ තැන්පත් කිරීමෙන් වළකින ලෙස මහජනතාවට මෙයින් අවවාද කරනු ලැබේ." - **ශ්‍රී ලංකා මහ බැංකු නිල පුවත්පත් නිවේදන***

මහ බැංකුව විසින් පළ කර ඇති මෙම පුවත්පත් දැන්වීමෙන් මූල්‍ය සමාගම් වල තැන්පතු සඳහා ඔවුන් වග නොකියන බව, කිසියම් ආයතනයක ප්‍රතිලාභ වැඩි නම් එහි අවදානම ද වැඩි බවත්, තමන්ගේ මුදල් පිළිබඳව තමා විසින්ම අවදානම දැරීමට සිදු වන බවත් පැහැදිලිවම අවධාරණය කර ඇත.

තවද, ඉහත සඳහන් මූල්‍ය සමාගම් අතුරින් ETI මූල්‍ය සමාගමේ ව්‍යාපාර 2020 ජූලි 13 සිට අත්හිටුවා ඇත. TKS සමාගමේ බලපත්‍රය ද අවලංගු කරමින් ඇවර කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

Kanrich Finance, ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්, රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්, සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්, සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ් යන මූල්‍ය සමාගම් ලැයිස්තුගත පොදු සමාගම් නොවන (Not a PLC) අතර ඒවා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ දෛනිකව මිල ප්‍රකාශ වන ඒවා නොවේ. මේවායේ හිමිකාරිත්ව ආයෝජනයන් උපලබ්ධි කිරීම සඳහා විවෘත වෙළෙඳපොළේ අවස්ථාවක් නොමැත.

- බොහෝ මූල්‍ය සමාගම් විසින් ඔරොත්තු නොදෙන ප්‍රමාණයේ පොළී අනුපාතයන් ඉදිරිපත් කර මහජනතාවගේ තැන්පත් රැස් කරන අතර, මෙම තැන්පතු සාමාන්‍ය වෙළෙඳපොළ පොළී අනුපාතයන්ට වඩා ඉතා අධික පොළී අනුපාතයන් ලබා දීමෙන් වෙළඳපොළ පොළී අනුපාතයන් විකෘතිකරණය (Distortion) සිදු කරයි. මෙම තත්ත්වය යටතේ මූල්‍ය සමාගම් වල අක්‍රමික ණය ඉහළ යන අතර, ද්‍රවශීලතා අර්බුදයන්ට ලක් වෙමින් තිරසාරත්වයට තර්ජනයන් සිදු වේ.
  තවද, වැඩි පොළී අනුපාත තැන්පත් සඳහා ගෙවමින් ණය පොළී අනුපාත අධික ලෙස අය කරමින් කටයුතු කරන මූල්‍ය සමාගම් සාර්ව ආර්ථිකය තුළ අවිධිමත් මුදල් වෙළෙඳපොළක් සහ අසාධාරණ පොළී අනුපාතයන් නිර්මාණය කරමින්, සාමාන්‍ය ජනතාව සූරා කෑමට සහ පීඩනයට පත් කරන (Usurious Money Lenders හෙවත් Shylock) අතර, ගැමි ජනතාවගේ තැන්පත් රැස් කර ඒවා මෙම මූල්‍ය සමාගම් වලට සමුපකාර සමිති විසින් ලබා දීමෙන් මෙම සූරා කෑමට සහාය දෙනවා පමණක් නොව රටේ අසංවිධිත මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාත ඉහළ දැමීමට ද සහාය වීමෙන් සමුපකාර ප්‍රතිපත්තීන්ට සහ සංකල්පයන්ට පටහැනි වීමක් සිදු වනු ඇත.

- බොහෝ මූල්‍ය සමාගම් වල පරිපාලනය සහ උපක්‍රමික තීරණයන් ගනු ලබන්නේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා වන අතර, හෙතෙම එය තමාගේ පුද්ගලික ව්‍යාපාරයක් මෙන් මෙහෙයවමින් එහි ඇති මහජන තැන්පත් තම පෞද්ගලික අරමුණු ඉටු කර ගැනීම සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව විවිධ කටයුතු වලට උපයෝජනය කරයි. මෙහිදී සිදු වන ද්‍රවශීලතා අර්බුද වලදී තැන්පත්කරුවන්ට ගෙවීම සඳහා යළි යළිත් වැඩි පොළී අනුපාතයන් ඉදිරිපත් කරමින් සහ විවිධ ලොතරැයි ක්‍රම, තෑගි ක්‍රම සහ විශාල ප්‍රමාණයේ තැන්පත්කරුවන්ට අප්‍රසිද්ධියේ කොමිස් මුදල් වැනි දෑ ලබා දෙමින් තැන්පතු ආකර්ෂණය කර ගනී. මෙම ක්‍රමය ජාත්‍යන්තර මූල්‍ය ව්‍යාපාර පද්ධතියේ හඳුන්වනු ලබන්නේ පොන්සි (Poncy) ක්‍රමය වශයෙනි.

පිරමීඩ ක්‍රමය ද මෙයට බොහෝ දුරට සමාන ය. මෙය මූලික වශයෙන් තැන්පත්කරුවන් රවටා මුදල් රැස් කර ගැනීමක් වන අතර, එක්තරා අවස්ථාවකට පසු නව තැන්පත්කරුවන්ට සිය තැන්පතු ලබා ගැනීමට නොහැකි වීමෙන් පොන්සි ක්‍රමය සහ පිරමීඩ ක්‍රමය බිඳ වැටීමෙන් මෙම ව්‍යාජත්වය ගැන නොදැන සිය මුදල් තැන්පත් කළ පිරිසට එකහ වූ පොළිය තබා තම මුල් තැන්පතුවවත් ලබා ගැනීමට නොහැකි වේ.

ඉතාලි ජාතික චාල්ස් පොන්සි නැමැත්තා පසුව අධිකරණයෙන් වරදකරුවෙකු වී සිරගත වන තෙක් මෙම ක්‍රමය මඟින් පොදු ජනතාව රවටා ව්‍යාජ අපේක්ෂාවන් ඇති කරමින් මුදල් රැස් කරමින් තැන්පත්කරුවන් රැවටූ අතර, අප රටේ ද CIFL, Pramuka, වණික්, සක්විති, දඩුවම් මුදලාලි, ETI, ස්වර්ණමහල් ෆිනෑන්ස් යන පුද්ගලයන් සහ ආයතන නිදසුන් වේ.

**පිරමීඩ ක්‍රම**

ඇතැම් සමුපකාර සමිති බල ප්‍රදේශ වල අහිංසක ජනතාව රවටා මෙවැනි ක්‍රම ක්‍රියාත්මක කරන අතර, ඒ හේතුවෙන් සමුපකාර මූල්‍ය සේවා පද්ධතියට රැස් කළ හැකි තැන්පතු මෙවැනි ව්‍යාජ පුද්ගලයන් වෙත ලබා ගැනීමට හැකිවනවා පමණක් නොව සාමාන්‍ය ජනතාව දුක් මහන්සි වී උපයන මුදල් නැති වී යාමට ද හේතු වේ. මෙම නීති විරෝධී කාර්යය දැනට ක්‍රියාත්මක වන,

*2005 අංක 02 දරණ බැංකු සංශෝධන පනතේ 38 වන වගන්තිය අනුව, මුදලින් හෝ මූල්‍ය වටිනාකමකින් දායක වීමට හෝ මුදල් හෝ මූල්‍ය වටිනාකමක් ගෙවීමට සහභාගීකරුවෙකුට නියම කරන සහ සහභාගීකරුවෙකු සහ උපයනු ලබන ප්‍රතිලාභ -*

*(අ) සහභාගීකරුවන්ගේ සංඛ්‍යාවේ වැඩි වීම මත ; හෝ,*

*(ආ) එම සහභාගීකරුවන් විසින් ගෙවා ඇති දායක මුදල් වැඩි වීම මත,*

*ප්‍රධාන වශයෙන් තීරණය වන්නා වූ යෝජනා ක්‍රමයක් කිසිම තැනැත්තෙකු විසින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරය කිරීම, පැවැත්වීම, මුදල් සැපයීම, කළමනාකරණය කිරීම හෝ විධාන කිරීම නොකළ යුතු ය. මේ සඳහා දණ්ඩනය වරදකරු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුකරනු ලැබීමේ දී අවුරුදු 03කට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම හෝ රුපියල් මිලියන 1ක් නොඉක්මවන දඩයකට යන දඬුවම් දෙකටම යටත් කළ හැක. තවද, එම ක්‍රියාව මඟින් වෙනත් තැනැත්තෙකුට අලාභයක් සිදු කරන බව දැන දැනම සිදු වූ අවස්ථාවක අවුරුදු 03කට නොඅඩු සහ අවුරුදු 05කට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමක් සහ රුපියල් මිලියන 02ක් හෝ එම යෝජනා ක්‍රමයෙන් රැස් කළ මුදලෙන දෙගුණයක් යන දෙකෙන් වැඩි මුදලට සමාන දඩ මුදලකට සමාන විය යුතු ය.*

**මූල්‍ය සමාගම්වල ආයෝජනය කිරීමට ප්‍රථම සළකා බැලිය යුතු කරුණු**

- ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී බැංකු විශාල ප්‍රමාණයක් ඇති බැවින් ඒවායේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාකාරී බව පිළිබඳව මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අඛණ්ඩව ස්ථානීය සහ සුරක්ෂිත අධීක්ෂණයන්ට කටයුතු කරන හෙයින් සහ ජාත්‍යන්තර බාසල් සම්මුතියට අනුව ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගෙන යන බැවින් මේවායේ තැන්පතුකරුවන්ද ආරක්ෂා වේ.

  තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්ට අනුව ගිණුම්කරණ කටයුතු සිදු කෙරෙන හෙයිනුත් 1988 අංක 30 දරණ බැංකු පණත අනුව මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති යහපත් පාලන පරිචයන් සහ ගිණුම් ප්‍රකාශන හෙළි කිරීමේ අවශ්‍යතාවන් මැනවින් ක්‍රියාත්මක කෙරෙන හෙයිනුත් ද්‍රවශීලතා අර්බුද ඇති වීමට ඉඩකඩ නොමැත.

  එහෙයින්, මූල්‍ය සමාගම්වල මුදල් තැන්පත් කරනු වෙනුවට අවදානම් අඩු බලපත්‍රලාභී බැංකු අංශයේ ආයෝජනයන් සිදු කිරීම ඥාණාන්විත වේ.

  කිසි විටෙකත් තම අතිරික්ත මුදල් මූල්‍ය සමාගම් වල තැන්පත් කිරීමෙන් වැළකී බැංකු අංශයේ පමණක් සිදු කරමින්, මෙතෙක් මූල්‍ය සමාගම් වල තැන්පත් කර ඇති අරමුදල් ආපසු ලබා ගෙන රාජ්‍ය බැංකු වල සහ රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කිරීම සුදුසු ය.

- මේ අනුව අපගේ ඇතැම් පළාත් කොමසාරිස්වරුන් විසින් දැනටමත් තමන් යටතේ පවත්නා සමිති වෙත මේ අනුව කටයුතු කිරීමට චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම ප්‍රසංශනීයයි.

**03. මූල්‍ය උපකරණ වල ආයෝජනය**

- දිවයිනේ මුදල් වෙළෙඳපොළේ සහ ප්‍රාග්ධන වෙළෙඳපොලේ ගනුදෙනු කෙරෙන ප්‍රධාන මූල්‍ය උපකරණ තෙවර්ගයක් වේ. එනම්, සාංගමික හිමිකාරත්ව සහ (Corporate Equity) සාංගමික ණය උපකරණ යි. (Corporate Debt) තෙවන වර්ගය වනුයේ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ රජයේ සුරැකුම්පත් වශයෙන් නිකුත් කරන අතිශයින් සුරක්ෂිත (Gilt edged) සුරැකුම්පත් ය. තෙවන වර්ගය සම්පූර්ණයෙන් ම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන අතර, මේවා පරිණතියේ දී අපහසුවකින් තොරව උපලබ්ධි කර ගැනීමට හෝ ඊට ප්‍රථම දරන්නවුන්ට ද්‍රවශීලතාව සඳහා වට්ටම් කර ගැනීමට හැකියාවක් ඇත. මෙම උපකරණ වල අවදානම ශූන්‍ය ලෙස සැළකෙන අතර, ඊට සාපේක්ෂව ඉපයුම් ප්‍රමාණය අවම තත්ත්වයක ඇත.

  මේවායේ ආයෝජනය කිරීම අවදානම් රහිත වුවත්, සමුපකාර සමිති විසින් මේවා මිලදී ගත යුත්තේ මහ බැංකුවේ බලයලත් රාජ්‍ය ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් පමණි. පෞද්ගලික ප්‍රාථමික අලෙවිකරුවෙකු වන Entrust ආයතනයෙන් මිලදී ගත් එක්තරා සමුපකාර ආයතනයකට සිදු වී ඇති අලාභය රුපියල් මිලියන ගණනක් වන අතර, එම මුදල් දැනට වසර ගණනක් ගත වී ඇතත් තවමත් අය කර ගත නොහැකි වූ හෙයින් එම ග්‍රාමීය බැංකු තැන්පතු ආපසු ගෙවීමට නොහැකි වී ඇත.

**04. අතිරික්ත අරමුදල් සහ ග්‍රාමීය බැංකු අංශයේ මහජන තැන්පතු භාවිතා කරමින් නිශ්චල දේපළ වල ආයෝජනය කරමින් දේපළ වෙළෙඳාමේ යෙදීම.** (Investment in Immovable Properties and Real Estates)

මූල්‍ය සේවා සමිති වල මහජන තැන්පතු ගොඩ නැගී ඇත්තේ අනාගතය වෙනුවෙන් විවිධ අපේක්ෂාවන් මත තම වත්මන් පාරිභෝජනය කල් දමා ඉතිරි කරන ලද සාමාන්‍ය ජනතාවගේ මුදල් ය. ඒවා ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි ඉල්ලූ විගස ආපසු දීමට කටයුතු නොකළහොත් විශ්වාසය පළුදු වීමෙන් එම සමිතියට පමණක් නොව සමස්ථ සමුපකාර පද්ධතියටම ප්‍රතිරූපීය අවදානමක් ජනිත වේ. එහෙයින් අරමුදල් වල නොගැළපීමක් (Mismatch) වළක්වාලමින් ආයතනයන්ගේ සුමට ක්‍රියාකාරීත්වය තුළින් විශ්වාසනීයත්වය රැක ගැනීම සඳහා අවශ්‍ය කරන ද්‍රවශීලතාව නොඅඩුව රඳවා ගැනීම සඳහා මෙවැනි මධ්‍යකාලීන සහ දිගු කාලීන ආයෝජනයන්ගෙන් වැළකී සිටිය යුතු අතර, එවැනි ආයෝජනයන් කළ යුත්තේ මූල්‍ය සේවා සමුපකාර සමිතියේ විගණනය කරන ලද සත්‍ය හා සාධාරණ ශුද්ධ ලාභය හෝ බාහිර ණය මුදල් හෝ ප්‍රතිමූල්‍ය පහසුකම් ආදිය මඟින් ය.

මෙම නියාමන උපදෙස් ඔබ පළාතේ සියළුම ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිතිවලට/ සංගම්වලට සන්නිවේදනය කිරීමටත්, ඔබ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අවබෝධ කර දී ඔවුන් විසින් සිදු කරනු ලබන සංවර්ධන සහ අධීක්ෂණ කාර්යයන් මෙන්ම විගණන කටයුතු ද බෙහෙවින් සාර්ථක කර ගැනීමත් කළ යුතු බව කාරුණිකව සිහිපත් කරමු.

සුවින්ද එස්. සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්